සුජාතා විද්‍යාලය
නුගේගොඩ
හයිලන්ඩ්ස් විද්‍යාලය
මහරගම

වාරය / වර්ෂය - දෙවන වාර පරීක්ෂණය - 2023	ශ්‍රේණිය - 11
විෂය - ගණිතය I	කාලය - පැය 2

නම -

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයා ඇති ඉඩ ප්‍රමාණය මත ලියන්න.

A කොටස

1. $\sqrt{23}$ හි අගය කුමන අනුයාත පූර්ණ සංඛ්‍යා අතර පිහිටයිද?

2. $9x^2y, 6xy^2$ යන පදවල කුඩාම පොදු ගුණාකාරය සොයන්න.

3 . පහත වෙන් රූපයෙහි $A \cap B'$ ප්‍රදේශය අඳුරු කරන්න.



4. පහත රූපයේ දැක්වෙන තොරතුරු අනුව,

(i) DC දිග සොයන්න.

(ii) ED දිග සොයන්න.



සියලු ම හිමිකම් ඇවිරිණි. (සු.වි.නු /හ.වි.ම - 2023)

5. වාහනයක චලිතය සම්බන්ධයෙන් පහත දුර කාල ප්‍රස්තාරය ගොඩනගා ඇත. වාහනයේ මධ්‍යක වේගය km/h වලින් සොයන්න.



6. පහත රූපයේ x වලින් දැක්වෙන කෝණයෙහි අගය සොයන්න.



7. ළමයින් කණ්ඩායමකට එක්තරා ගණිත ගැටලුවක් විසදීමට ගතවූ කාලය ඇසුරෙන් පහත වගුව ගොඩනගා ඇත.

කාලය (මිනිත්තු)	$6-10$	$11-15$	$16-20$
ළමයි ගණන	5	13	8

එහි $11-15$ පන්ති ප්‍රාන්තරයේ

(i) ඉහළ සීමාව (ii) පහළ මායිම ලියන්න.

8. පහත ත්‍රිකෝණයෙහි $x+y=150°$, $x+z=160°$ නම්, $y+z$ හි අගය සොයන්න.



9. එක්තරා වැඩක් අවසන් කිරීමට මිනිසුන් 3 දෙනෙකුට දින 6 ක් ගතවේ යැයි ඇස්තමේන්තු කර ඇත. මුලදී මෙම කාර්යය සඳහා මිනිසුන් 5 දෙනෙකු යොදවන අතර, දින දෙකකට පසු එක් අයෙකු කාර්යයෙන් ඉවත් වේ. ඉතිරි 4 දෙනාට ඉතිරි කොටස නිම කිරීමට දින කීයක් ගතවේද?

mathematica.lk

10. $ABCD$ සමාන්තරාස්‍රයකි. එහි විකර්ණය O හිදී කැපේ. $AD = 5cm, AC = 8cm, BD = 10cm$ නම්, OBC ත්‍රිකෝණයේ පරිමිතිය කොපමණද?



11. $(2,7), (0,3)$ ලක්ෂ්‍ය හරහා යන සරල රේඛාවේ අනුක්‍රමණය සහ අන්තඃඛණ්ඩය ලියන්න.

12. ඍජු සිලින්ඩරයක වක්‍ර පෘෂ්ඨ වර්ගඵලය $880cm^2$ වේ. එහි වෘත්තාකාර මුහුණතක අරය $14cm$ නම්, සිලින්ඩරයේ උස සොයන්න.

13. පහත කෝණ අතරින් අංගසම ත්‍රිකෝණ යුගලය නම් කර, අංගසම අවස්ථාව ද ලියන්න.



14. $log_3 81 = 4$ යන්න දර්ශක ආකාරයෙන් ලියන්න.

15. මුද්‍රණය කරන ලද ලොතරැයි පත් 500 ක් අතරින් දිනුමක් සහිත ටිකට්පත් ගණන 7කි. ලොතරැයිපත් සියල්ල විකුණන ලද නම්, එක් ටිකට් පතක් මිලදී ගතු අයෙකුට දිනුමක් නොලැබීමේ සම්භාවිතාවය සොයන්න.

mathematica.lk

16. රූප සටහනේ දී ඇති තොරතුරු අනුව සමද්විපාද ත්‍රිකෝණයක් නම් කරන්න.



17. $\frac{12a^2b}{5xy} \div \frac{6ab^2}{x^2}$ සුළු කරන්න.

18. ත්‍රිකෝණාකාර හරස්කඩක් සහිත ඍජු ප්‍රිස්මයක දිග $10cm$ වේ. හරස්කඩ ත්‍රිකෝණාකාර මුහුණතක දළ සටහනක් පහත දැක්වේ. එහි ඊට වෙනස් මුහුණත් දෙකක දළ සටහන් මිණුම් සහිතව අඳින්න.



19. $x \geq -2$ අසමානතාවයෙහි විසඳුම් පහත සංඛ්‍යා රේඛාව මත දක්වන්න.



20. පහත ත්‍රිකෝණයේ x මගින් දැක්වෙන දිග සොයන්න.



21. $x^2 + 2x - 15$ වර්ගජ ප්‍රකාශනයේ සාධක සොයන්න.

mathematica.lk

22. වාර්ෂික වටිනාකම රු.30 000 ක් ලෙස තක්සේරු කළ නිවසකත් සඳහා වාර්ෂික වරිපනම් බදු ප්‍රතිශතය 8% නම්, කාර්තුවකට ගෙවිය යුතු බදු මුදල කොපමණද?

23. $3x - \mathrm{y} = 13$ සහ $x - \mathrm{y} = 3$ නම් x හි අගය සොයන්න.

24. කේන්ද්‍ර කෝණය 90° වූ කේන්ද්‍රික ඛණ්ඩයක පරිමිතිය $50cm$ වන අතර එහි චාප දිග $22cm$ වේ. එහි අරය සොයන්න.

25. P සහ Q ලක්ෂ්‍ය හරහා යන වෘත්තයක කේන්ද්‍රය AB රේඛාව මත පිහිටයි. වෘත්තයේ කේන්ද්‍රය O ලෙස නිර්මාණ රේඛා පැහැදිලිව දක්වමින් ලකුණු කරන්න.



mathematica.lk

B කොටස

1. සමන්ත තමාගේ මාසික වැටුප $1:6$ අනුපාතයට කොටස් දෙකකට වෙන්කර ඉන් පළමු කොටස ඉතිරිකිරීමේ ගිණුමක තැන්පත් කරයි. දෙවන කොටස වියදම් කරයි.

   (i) ඔහු වියදම් කරන මුදලින් $\frac{7}{20}$ ක් තම දෙමාපියන් වෙත යවයි නම්, එම මුදල ඔහුගේ වැටුපෙන් භාගයක් ලෙස ලියන්න.

   (ii) දෙමාපියන්ට යවූ පසු ඉතිරි මුදලෙන් $\frac{5}{13}$ ක් ඔහුගේ ගමන් වියදම් වේ. එය වැටුපෙහි භාගයක් ලෙස දක්වන්න.

   (iii) ගමන් වියදම රු.4 500 නම් ඔහුගේ වැටුප කොපමණද?

   (iv) ඔහු දෙමාපියන්ට යැවූ මුදල සොයන්න.

2. අයෙක් රු.45 000 ක් වැයකර කොටසකට රු.3 ක ලාභාංශයක් ගෙවන සමාගමක කොටස් රු.15 බැගින් මිලදී ගනියි.

   (i) මිලදී ගත් කොටස් ගණන කොපමණද?

   (ii) වාර්ෂික ලාභාංශය කොපමණද?

   (iii) වාර්ෂික ලාභාංශය ලබාගත් පසු කොටස් සියල්ල එකක් රු.12.60 බැගින් විකුණයි. ඔහුට සිදුවන ප්‍රාග්ධන අලාභය කොපමණද?

   (iv) මෙම ගනුදෙනුව අවසානයේදී ඔහුට සිදුවන සමස්ථ ලාභය හෝ අලාභය කොපමණද?

   (v) සමස්ථ ලාභය හෝ අලාභය යෙදූ මුදලේ ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

mathematica.lk

3. සෘජුකෝණාස්‍රාකාර ඉඩමක එක් අන්තයක ඉඩමේ පළල අරය ලෙස ගෙන කේන්ද්‍රික ඛණ්ඩ ආකාරයේ පොකුණක් තනා ඇත. (රූපය බලන්න.)



(i) EB චාප දිග සොයන්න.

(ii) පොකුණ හැරුණු විට ඉතිරි ඉඩම් කොටසේ පරිමිතිය සොයන්න.

(iii) පොකුණ පතුලේ වර්ගඵලය සොයන්න.

(iv) පොකුණ පතුලට සමාන වර්ගඵලයක් සහිත පතුලක් ඇති සෘජුකෝණාස්‍රාකාර පොකුණක් AD මායිම එක් මායිමක් වන සේ සකස් කරයි නම්, එය ඉහත රූපය තුළ මිණුම් සහිතව ඇඳ දක්වන්න.

4. මුහුණත්වල 1,2,3,4,5,6 සටහන් කළ සමබර ඝනකාකාර දාදු කැටයක් ද මුහුණත්වල 1,2,3,4 සටහන් කළ සමබර චතුස්තලාකාර දාදු කැටයක් ද එකවර මේසයක මත පෙරලා මේසය මතුපිට ස්පර්ශ වන පැත්තෙහි අගය සටහන් කරනු ලැබේ.

(i) එහිදී ලැබිය හැකි ප්‍රතිඵල ඇසුරෙන් සකස් කරන ලද අසම්පූර්ණ කොටු දැලක් පහත දැක්වේ. සිද්ධි නිරූපනය කිරීමට × ලකුණ යොදමින් එය සම්පූර්ණ කරන්න.

(ii) අය ගණන්වල එකතුව ලෙස 4 ලැබීමේ සිද්ධිය කොටුදැලෙහි වටකොට දක්වා, එහි සම්භාවිතාවය ලියන්න.



(iii) එකතුව ලෙස 4 ලැබීම හෝ නොලැබීම දැක්වීමට පහත රුක්සටහන සම්පූර්ණ කරන්න.



සියලු ම හිමිකම් ඇවිරිණි. (සු.වි.නු / හ.වි.ම - 2023)

(iv) මෙම පරීක්ෂණය නැවත වතාවක් සිදුකරන්නේ නම්, එහි ප්‍රතිඵල දැක්වීමට ඉහත රුක්සටහන දීර්ඝ කරන්න.

(v) එකතුව 4 ලෙස දෙවරම ලැබීමේ සම්භාවිතාවය රුක්සටහන ඇසුරෙන් සොයන්න.

---

5. එක්තරා කාලයක් තුල අධිවේගී මාර්ගයක ගමන් කළ වාහන 50ක වේගය පිළිබඳ තොරතුරු පහත වගුවේ ඇතුලත් වේ. (මෙහි $55 - 65$ යනු 55 ට වැඩි එහෙත් 65 හෝ 65 ට අඩු යන්නයි.)

වේගය (km/h)	$55 - 65$	$65 - 75$	$75 - 85$	$85 - 95$	$95 - 105$	$105 - 115$
වාහන ගණන	2	5	26	12		2
සමුච්චිත සංඛ්‍යාතය	2		33	45	48	50

(i) දී ඇති වගුවෙහි හිස්තැන් පුරවන්න.

(ii) ඉහත තොරතුරු ඇසුරෙන් පහත කොටුදැල මත සමුච්චිත සංඛ්‍යාත වක්‍රය අඳින්න.



(iii) වාහන අතරින් අඩුම වේගයෙන් යන 25% සාමාන්‍ය මාර්ගය වෙත යොමු කෙරේ නම්, එසේ යොමු කෙරෙන්නේ වේගය පැයට කිලෝමීටර කීයට අඩු වාහනද?

(iv) වේගය $\mathbf{95km/h}$ ට වැඩි වාහන ගණන මුලු වාහන ගණනේ ප්‍රතිශතයක් ලෙස ලියන්න.

සැකසුම- වජිරපානි අරවින්ද මයා
2023.06.14

වාරය / වර්ෂය - දෙවන වාර පරීක්ෂණය - 2023	ශ්‍රේණිය - 11
විෂය - ගණිතය I I	කාලය - පැය 3
නම -	

A කොටසින් ප්‍රශ්න 5කටත් B කොටසින් ප්‍රශ්න 5කටත් පිළිතුරු සපයන්න.

පතුලේ අරය r ද , උස h ද වන කේතුවක පරිමාව $\frac{1}{3}\pi r^2 h$ වේ. අරය r වන ගෝලයක පරිමාව $\frac{4}{3}\pi r^3$ වේ.

A කොටස

1. රු.25000 ක් මිල වූ භාණ්ඩයක් රු.7000 ක මූලික ගෙවීමක් සහිතව යම් පුද්ගලයෙක් රැගෙන යයි. ඉතිරි මුදල 24% ක වාර්ෂික පොලියක් සහිතව සමාන මාසික වාරික 12 කින් ගෙවිය යුතුය. පොලිය අයකරන්නේ හීනවන ශේෂයට නම් මාසික වාරිකය ගණනය කරන්න.

2. (a) මෙහි දැක්වෙන්නේ වර්ග පදයේ සංගුණකය 1වන වර්ගජ ශ්‍රිතයක ප්‍රස්තාරයකි. එය ඇසුරෙන් පිළිතුරු සපයන්න.



(i) හැරුම් ලක්ෂයයේ ඛණ්ඩාංක ඇසුරෙන් අදාල ශ්‍රිතය $y = b \pm (x \pm a)^2$ ආකාරයට ලියන්න. (මෙහි a හා b යනු නිඛිල වේ.)

(ii) ඒ ඇසුරෙන් $\sqrt{5}$ හි අගය ආසන්න පළමු දශමස්ථානයට සොයන්න.

(b) පහත දැක්වෙන්නේ $y = (x-2)(x+1)$ ශ්‍රිතය ප්‍රස්තාරගත කිරීමට සකස් කරන ලද අසම්පූර්ණ වගුවකි.

x	-2	-1	0	1	2	3
y	4	0		-2	0	4

(i) $x = 0$ විට, y හි අගය සොයන්න.

(ii) x අක්ෂය දිගේත් y අක්ෂය දිගේත් කුඩා බෙදුම් 10කින් ඒකක එකක් දැක්වෙන සේ ඉහත ශ්‍රිතය ප්‍රස්තාරගත කරන්න.

mathematica.lk

සියලු ම හිමිකම් ඇවිරිණි. (සු.වි.නු /හ.වි.ම - 2023)

3. අරය ඒකක r වූ අර්ධ වෘත්තාකාර ආස්තරයකින් ත්‍රිකෝණාකාර කොටසක ඉවත් කළ විට ඉතිරි කොටසේ වර්ගඵලය වර්ග ඒකක 8කි. (රූප සටහනේ අඳුරු කර ඇති කොටස බලන්න.)



(මෙහි h යනු අර්ධ වෘත්තයේ අරයට වඩා ඒකක 4ක් අඩු දිගකි.)

(i) $r^2 + 7r = 14$ වන බව පෙන්වන්න.

(ii) $\sqrt{105} = 10.2$ නම් r හි අගය සොයන්න.

4. තරුණ කණ්ඩායමක් පොසොන් සමයේ දන්සැලක් පැවැත්වීම සඳහා පරිත්‍යාගශීලීන්ගේ ආධාර එකතුකරන ලදි. එහිදී එක් එක් පරිත්‍යාගශීලියා ලබා දෙන ලද මුදල ඇසුරෙන් පහත වගුව ගොඩනගා ඇත. (මෙහි $100 - 200$ යනු 100 හෝ 100 ට වැඩි එහෙත් 200 ට අඩු යන්නයි.)

පරිත්‍යාග කල මුදල	$100 - 200$	$200 - 300$	$300 - 400$	$400 - 500$	$500 - 600$	$600 - 700$
පරිත්‍යාගශීලීන් ගණන	17	13	10	5	3	2

(i) මධ්‍යස්ථ පන්තිය සොයන්න.

(ii) $300 - 400$ පන්ති ප්‍රාන්තරයේ මධ්‍ය අගය උපකල්පිත මධ්‍යන්‍යය ලෙස ගෙන පරිත්‍යාගශීලියෙකු පරිත්‍යාග කළ මධ්‍යන්‍ය මුදල සොයන්න.

(iii) ඉහත (ii) කොටසේ පිළිතුරට අනුව දන්සැලට එකතු වූ මුළු මුදල සොයන්න.

(iv) දන්සැලට වැයවූ මුදල රු.12 700 බවත්, එකතු වූ මුදල ඒ සඳහා ප්‍රමාණවත් නොවූ බවත් තරුණ කණ්ඩායම ප්‍රකාශ කරයි. මෙම ප්‍රකාශය සත්‍ය විය හැකි බව ගණනය කර පෙන්වන්න.

5. මාලා රතු නෙළුම් මල් 7ක් සහ සුදු නෙළුම් මල් 3ක් රු.135 කට මිල දී ගත්තාය. රතු නෙළුම් මලක මිල සුදු නෙළුම් මලක මිලට වඩා රු.5 ක් වැඩිය.

(i) රතු නෙළුම් මලක මිල රු. x ලෙසද, සුදු නෙළුම් මලක මිල රු. y ලෙස ද ගෙන සමගාමී සමීකරණ යුගලයක් ගොඩනගන්න.

(ii) ඉහත සමීකරණ යුගල විසඳා x සහ y සොයන්න.

(iii) ඇය එම මිලටම රතු නෙළුම් මල් යම් ගණනකුත්, සුදු නෙළුම් මල් එමෙන් තුන් ගුණයකුත් මිලදී ගැනීමට රු.90 ක් වැය කළාය. සරල සමීකරණයක් ගොඩනගා ඒ ඇසුරෙන් ඇය එම අවස්ථාවේ මිල දී ගත් රතු නෙළුම් මල් ගණන සොයන්න.

6. තිරස් පොළොවේ පිහිටි සිරස් කණුවක් දෙස කණුව පාමුලට යම් දුරකින් පොළොව මත සිට බලන විට කණුව මුදුනේ ආරෝහණ කෝණය $42°$ ක් විය. එතැන් සිට කණුව දෙසට $40m$ දුරක් ගොස් බලන විට කණුව මුදුනේ ආරෝහණ කෝණය $65°$ ක් විය.

(i) තොරතුරු දැක්වීමට දළ රූපයක් අඳින්න.

(ii) $1cm$ කින් $10m$ දැක්වෙන සේ ඉහත තොරතුරු දැක්වීමට පරිමාණ රූපයක් අඳින්න.

(iii) කණුවේ උස පරිමාණ රූපය ඇසුරෙන් සොයන්න.

(iv) කණුව මුදුනේ සිට $85m$ දුරින් පොළොව මත පිහිටි ලක්ෂ්‍යයක් දෙස කණුව මුදුනේ සිට බලන විට එය පෙනෙන අවරෝහණ කෝණය සොයන්න.

mathematica.lk

B කොටස

7\. (a) සරඹ සංදර්ශනයක සඳහා සිසුන් පිරිසක් තනි පෙළකට පෙළ ගස්වා සිටී. සරඹ සංදර්ශනයේ දී පළමු සිසුවා $3m$ ද, අනෙක් සෑම සිසුවෙක්ම තමාට පෙර සිසුවා ගමන් කළ දුර මෙන් දෙගුණයක් වන සේ ද ඉදිරියට ගමන කළ යුතුය. සිසුන් ඉදිරියට ගමන් කරන දුර පිළිවෙළින් ගත්විට ගුණෝත්තර ශ්‍රේඪියක පිහිටයි.

(i) පළමු , දෙවන සහ තෙවන සිසුවා ගමන් කළ දුරෙහි එකතුව මීටර් කීයද?

(ii) 6 වන සිසුවා ඉදිරියට ගමන් කරන දුර සූත්‍ර භාවිතයෙන් සොයන්න.

(b) ආරම්භයේ දී සිසුන් පෙළගැසී සිටින්නේ මුල් සිසුන් දෙදෙනා අතර පරතරය $3m$ ද, ඊට පසු පිළිවෙළින් සෑම සිසුන් දෙදෙනෙකු අතරම පරතරය ඊට පෙර සිසුන් දෙදෙනා අතර පරතරයට වඩා $2m$ බැගින්ද වැඩිවන සේය.



(i) අවසන් සිසුන් දෙදෙනා අතර පරතරය $21m$ නම්, පෙළහි සිටින මුලු සිසුන් ගණන සූත්‍ර භාවිතයෙන් සොයන්න.

(ii) පළමු සිසුවා සහ හයවන සිසුවා අතර පරතරය සූත්‍ර භාවිතයෙන් සොයන්න.

8\. පහත නිර්මාණය සඳහා කවකටුව සහ සරල දාරය භාවිතා කරන්න. නිර්මාණ රේඛා පැහැදිලිව දක්වන්න.

(i) $BC = 10cm, A\hat{C}B = 30°$ සහ $C\hat{B}A = 45°$ වූ ABC ත්‍රිකෝණය නිර්මාණය කරන්න.

(ii) A සිට BC රේඛාවට ලම්භයක් නිර්මාණය කරන්න.

(iii) AC පාදයේ ලම්භ සමච්ඡේදකය නිර්මාණය කරන්න.

(iv) AC විශ්කම්භය වන වෘත්තය නිර්මාණය කරන්න.

(v) $CD = 3cm$ සහ $A\hat{D}C = 90°$ වන සේ $ABCD$ උත්තල චතුරස්‍රය නිර්මාණය කරන්න.

9\.



කේන්ද්‍රය O වූ වෘත්තයේ AB විශ්කම්භයකි. AC, CB සහ DE ජ්‍යායන් වේ. C, O සහ E ඒක රේඛීය නොවන අතර AB සහ DE ලම්භක වේ. DE රේඛාවට AB රේඛාව X හිදී ද, AC රේඛාව Y හිදී ද කැපේ.

(i) පිටපත් කරගත් රූප සටහන සුදුසු පරිදි සම්පූර්ණ කර ABC සහ AXY ත්‍රිකෝණ සමකෝණී බව පෙන්වන්න.

(ii) $A\hat{O}C = A\hat{Y}X + A\hat{E}C$ බව පෙන්වන්න.

mathematica.lk

සියලු ම හිමිකම් ඇවිරිණි. (සු.වි.නු / හ.වි.ම - 2023)

10. රූපයේ $ABCF$ සමාන්තරාස්‍රයකි. $DC = FG$ වන පරිදි CF රේඛාව G තෙක් දික් කර ඇත.



(i) $ABDG$ සමාන්තරාස්‍රයක් බව සාධනය කරන්න.

(ii) GBD (වර්ගඵලය) $= ADF$ (වර්ගඵලය) $+ CBD$ (වර්ගඵලය) බව පෙන්වන්න.

(iii) AJG (වර්ගඵලය) $=$ BDJ (වර්ගඵලය) බව සාධනය කරන්න.

11. අරය r වූ ඝන ලෝහ අර්ධ ගෝලයක් උණුකර ලොහ අපතේ නොයන පරිදි පතුලේ අරය a ද, ලම්බ උස h ද වූ සෘජු ඝන කේතුවක් සාදනු ලැබේ.

(i) $a = \sqrt{\dfrac{2r^3}{h}}$ බව පෙන්වන්න.

(ii) $r = 3.75cm$ ද, $h = 0.98cm$ ද නම් a හි අගය ලඝුගණක වගුව භාවිතයෙන් සොයන්න.

12. පන්තියක ළමයින් 40 දෙනෙකි. ඉන් 50% ක් ගැහැණු ළමයින් වෙති.



(i) ගැහැණු ළමයින් ගණන සොයන්න.

(ii) ළමයින් අතරින් 32 දෙනෙක් පාසල් බස් රථයේ පැමිණෙන්නන් වේ. බස් රථයෙන් නොපැමිණෙන පිරිමි ළමයින් 5 දෙනෙකි. වෙන් රූපය පිටපත කරගෙන දී ඇති තොරතුරු ලකුණු කරන්න.

(iii) බස්රථයේ පැමිණෙන ගැහැණු ළමයින් කී දෙනාද?

(iv) බස්රථයේ නොපැමිණෙන ගැහැණු ළමයින් කී දෙනාද?

(v) බස්රථයේ නොපැමිණෙන ගැහැණු ළමයින් ද බස් රථයේ පැමිණීමට පටන් ගත්තේ නම්, නව තොරතුරු ඇසුරෙන් වෙන් රූපය නැවත අඳින්න.

සැකසුම- වජිරපානි අරවින්ද මයා (2023.07.05)

PARCEL NO

LOL.lk
BookStore

විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න

කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න